# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාවේ
# 19.07.2018 දින පැවැත්වූ දේශනාව

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුපියාණන්වහන්සේට සියලුම කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ පිරිසිදු සන්තානයක් ඇතිකර ගත්තා වූ ඒ පිරිසිඳු සිතින් ලෝක සත්වයා කෙරෙහි පහළ කරගත්තා වූ මහා කරුණාවෙන් ලෝකයාට ධර්ම දේශනා කළ වදාළා වූ දසබලධාරී වූ චතුවිශාරද වූ ශාන්තිනායක සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා! ඒ උතුම් වූ ශ්‍රී සත්ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා! අශ්ඨආර්‍යා පුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා!

අනන්ත අපරිමාණ ගුණ ඇති සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ ගුණ බලයෙන් ධර්ම රත්නයේ ගුණ බලයෙන් සංඝ රත්නයේ ගුණ බලයෙන් තුනුරුවන් වන්දනා කරගැනීමේ හිත පහදවා ගැනීමේ කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙන් මේ පින්වත් පිරිස මේ වෙනකොට ගොනු කරගත්තා වූ අනන්ත අපරිමාණ කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් සැම දෙනාටම අදත් මේ අභිධර්ම පාඩමක් හරහා කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නා වූ ධර්ම කාණ්ඩය ඉතාමත්ම හොඳින් පැහැදිලිව පිරිසිඳුව තේරුම් ගන්න ලැබේවා! ඒවාගේම සැම දෙනාගේම සිත්වල බාධක වශයෙන් කිසිම නීවරණ ධර්මයක් පහළ නොවේවා! මේ ධර්මය ඇසීම සීල සමාධි ප්‍රඥා වැඩීමක් වේවා! යෝනිසෝ මනසිකාරය පැවැත්වීමක් වේවා! සැමදෙනාටම මේ ධර්ම මාර්ගයේ ගමන්කොට චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කොටගෙන නිවනින් සැනසෙන්ට ලැබේවා! කියලා මෛත්‍රීයෙන් පළමු කොටම ප්‍රාර්ථනා කරනවා.

අද අපි මේ පින්වතුන්ට කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ තවත් ප්‍රත්‍යය ධර්මයක් පිළිබඳවයි. ගියවතාවේදී ප්‍රත්‍යය ධර්මයක වීථි කාණ්ඩය අපි මේ පින්වතුන්ට කියලා දුන්නා. අදත් ඊට සමාන කොටසක් තිබෙන්නේ. මේ පාඩම පරිපූර්ණ විය යුතු නිසා ඒ කොටස අපි අද ඉදිරිපත් කරගන්නවා. මේ කොටස මීට ඉස්සෙල්ලා සතියක මතක් කරපු ධර්ම කාණ්ඩ වලට සමානයි නමුත් අසමාන ගුණ ස්වභාවයකුත් ඒකෙ තිබෙනවා. මේ කාරණය ඉදිරිපත් කර ගන්න කොට ඒ වෙනසත් අපි තේරුම් ගත යුතුයි.

අද කථා කරන්න යන්නේ 'සමනන්තර ප්‍රත්‍යය' ධර්මයට අදාළ වීථි කොහොමද සකස් වෙන්නේ කියලා. මේ පින්වතුන්ට මතක ඇති අපි 'අනන්තර ප්‍රත්‍යය' පිළිබඳව සාකච්ඡා කළා. 'අනන්තර ප්‍රත්‍යය' කියලා කිව්වේ යම් කිසි සිතක් පහළ වෙලා ඒ සිත නැතිවෙලා යනකොට තව සිතක් පහළ වීමට ඒ නැතිවී යන්නා වූ සිතෙන් ලැබෙන රුකුල් ස්වභාවය. පළමුව පහළ වූ සිතින් යම් කිසි අමුතු ගුණ ශක්තියක් ධර්ම ශක්තියක් හේතුවෙනවා ඒවාගේම ප්‍රත්‍යය වෙනවා ඒ දෙවෙනි හිත පහළ වෙන්න. ඒ ධර්මය තමයි අපි කථා කළේ.

අද කියන කොටසින් අපි තේරුම් ගන්න ඕනෑ මේ 'සමනන්තර ප්‍රත්‍යය' 'අනන්තර ප්‍රත්‍යයට' සමාන බව. 'සමනන්තර ප්‍රත්‍යයයේ' තිබෙන්නේ 'අනන්තර ප්‍රත්‍යයේ' ගුණම තමයි නමුත් පොඩි විශේෂත්වයක් තිබෙනවා. ඒ තමයි යම් කිසි හිතක් ඊළඟට පහළ වෙනකොට ඒ පහළ වෙන හිතට මොකක් හරි දෙයක් පහළ වීමම නොවෙයි, නියමිත සුදුසු දෙයක් ඇතිවීමට පරිසරය සකස් කිරීමයි. ඒක තමයි 'සමනන්තර ප්‍රත්‍යය' කියලා කියන්නේ. එක සිතක් ඇතිවෙලා ඒ සිත නැතිවේගෙන යනකොට 'සමනන්තර ප්‍රත්‍යයෙන්' සිද්ධ කරන්නේ ඊළඟට පහළ වෙන්නා වූ සිත සුදුසු සිතක්, සුදුසු ධර්ම ස්වභාවයක්, සුදුසු නාම ස්වභාවයක් බවට පත් කිරීමයි. ඒක ක්‍රමානුකූලව පිළිවෙලකට හදන නිසාත් පසුව පසුව පහළ වෙන සිත්වල උප්පත්තියට මේක නියම ආකාරයෙන් ඉදිරිපත් වෙන නිසාත් ඒකට කියනවා 'සමනන්තර ප්‍රත්‍යය' කියලා. ඉස්සෙල්ලා කියපු 'අනන්තර ප්‍රත්‍යයෙන්' කිව්වේ ඊළඟ හිත පහළ වීමට ශක්තියක් දෙනවා කියන එක. මේකෙන් කියන්නේ ඊළඟ හිත පහළ වෙනකොට ඒ පහළ වෙන්න

සුදුසු සිතකට පරිසරය  හදලා දෙනවා කියන එකයි.  ශක්තිය දෙනවා කියන එකයි.

අද අපි පුළුවන් ප්‍රමාණයක් මේ කොටසට අදාළ කරගෙන සාකච්ඡා කරමු. තේරුම් ගන්න මහන්සි ගනිමු. මේක අතිශය ගැඹුරු කොට්ඨාසයක් කියන බවත් අපි අමතක කරන්න හොඳ නෑ.

සමනන්තර ප්‍රත්‍යයටත් තිබෙනවා සමාන වීථි කාණ්ඩයක්. මේවාට කියන්නේ විසර්ජනා වීථි කියලා.  සමනන්තර ප්‍රත්‍යය කුමක්ද,  ඒ ප්‍රත්‍යය ක්‍රියාත්මක වෙන්නා  වූ පිළිවෙල කියලා දෙන්නා වූ විසර්ජනා විථි 7  තිබෙනවා. ඒ හත අපි පිළිවෙලකට තේරුම් ගනිමු. අනන්තර ප්‍රත්‍යයේත් කිව්වා විසර්ජනා වීථි 7 ක්.

## 1) පළවෙනි විථිය

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො** = කුසල ධර්මය කුසල ධර්මයකට සමනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වෙනවා කියන එක.

මේක තේරුම් ගන්න ඕන මේ විදියට. හොඳට  බලන්න මේකේ තිබෙන්නාවූ විසර්ජනා වීථිය දක්වන්න භාවිතා කරලා තිබෙන පාලි කාණ්ඩය.

**කුසලො ධම්මො** = කුසල ධර්මය
**කුසලස්ස ධම්මස්ස** = තවත් කුසල ධර්මයක් පහළ වීමට
**සමනන්තරපච්චයෙන පච්චයො** = සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

- **පුරිමා පුරිමා කුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං සමනන්තරපච්චයෙන පච්චයො** = පළමුවෙන් පළමුවෙන් පහළ උනාවූ කුසල ධර්මයෝ පසුව පසුව පහළ වෙන්නාවූ කුසල ස්කන්ධයන්ට සමනන්තර  ප්‍රත්‍යය භාවයෙන්, ප්‍රත්‍යය ශක්තියෙන්, ගුණ ශක්තියෙන් උපකාර වෙනවා.

උදාහරණයක් හැටියට අපි මෙහෙම හිතමු. මතක ඇති ගියවතාවේදී අනන්තර ප්‍රත්‍යය කථා කරනකොට විථි පිළිබඳව කථා කළා. කුසල ධර්ම කියන ඒවා කථා කරන්න පුළුවන් කම තිබෙන්නේ ජවන් සිත්වල විතරයි. මේ ජවන් සිත්වල එනම් පළවෙනි ජවනය, දෙවෙනි ජවනය, තුන්වෙනි ජවනය, හතරවෙනි ජවනය, පස්වෙනි ජවනය, හයවෙනි ජවනය, හත්වෙනි යන ජවන් සිත් වල පහළ වෙනවා කුසල ඛන්ධ. කුසලා ඛන්ධා කියලා කියන්නේ, අපි හිතමු කෙනෙක් මලක් පහනක් පූජා කරනවා කියලා. ඒ කෙනා මලක් පහනක් පූජා කරන වේලාවේ එයාට ජවන් සිත්වලින් තොරව ඔය වැඩේ කරන්න බෑ. මල් කඩා ගැනීම. මල් එකතු කරගැනීම. මල් පිරිසිදු කිරීම. මල් තටුවක තැබීම. ඒවාගේම තටුවක තබලා පැන් ඉහලා ගාථාවක් කියලා පූජා කිරීම. ඔය ඔක්කෝටම තමයි අපි කියන්නේ මල් පූජා කරනවා කියලා. මේ ක්‍රියාව කරන්න බෑ ජවන් සිත් වලින් තොරව. පැහැදීමකින් තොරව. කුසල ධර්ම එක්කාසුවීමකින් තොරව. මේ ක්‍රියාව සිද්ධ කරන්න ඉදිරිපත් වෙන්නේ කාමාවචර කුසල් සිත් 8 න් එකක්. කාමාවචර කුසල් සිත් වැඩ කරන්නේ චිත්ත වීථියක් ජවන් තැනක.

අපි හිතමු මේක පළවෙනි කාමාවචර කුසල් සිත කියලා. ඒ කියන්නේ **සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික** සිත. කුසල් සිතක සෝභන චෛතසික 19 අනිවාර්යයෙන්ම පහළ වෙනවා. ඊළඟට පහළ වෙනවා **ප්‍රඥා** චෛතසිකය. මූලික වශයෙන් චෛතසික 20 ඉදිරිපත් උනා. තව තිබෙනවා සර්ව චිත්ත සාධාරණ සමග ප්‍රකීර්ණක (අන්‍යසමාන චෛතසික13) එක්ක ඔක්කොම චෛතසික 33 විතර වෙනවා. දැන් මේ 33 යි සිතයි ඔක්කොම 34 වෙනවා. මේ ටික ඔක්කොටම කියනවා කුසල ක්‍රියාවක් කරන්න ඉදිරිපත්වෙන කුසල ධර්ම කියලා. මේ ටික තමයි පළවෙනි ජවනයේ තිබෙන්නේ. දැන් ඔන්න පළවෙනියෙන්ම කුසල ස්කන්ධයක් ඇති උනා. මෙතැන කථා කරන්නේ ඛන්ධ වශයෙන්. **පුරිමා පුරිමා කුසලා ඛන්ධා** කියලා කියන්නේ මෙන්න මේ චිත්ත චෛතසික ධර්මයන් ටිකට.

මේ පළවෙනි ජවනය පහළ වෙලා නැතිවෙන කොට දෙවෙනි ජවනය එනවා. ඊළඟට තුන්වෙනි එක එනවා. ඊට පස්සේ හතර වෙනි එක එනවා. පස්වෙනි එක එනවා. ඔය වගේ පිළිවෙලට එනවා. දෙවෙනි එක පහළ වෙනකොට කියනවා **පච්ජිමානං පච්ජිමානං කුසලානං ඛන්ධානං** කියලා. චිත්ත වීථියක පළවෙනි එක **සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික කුසල** සිතක් නම් ඒ චිත්ත

වීථියේ දෙවෙනි එකත් ඒකම විය යුතුයි. ඒ චිත්ත වීථියේ තුන්වෙනි එකත් ඒකම විය යුතුයි. වෙන එකක් එන්නේ නෑ. එතකොට මේ සිත හත්වතාවක් යනවා. පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නාවූ කුසල ස්කන්ධයෝ පසුව පසුව පහළ වෙන්නාවූ කුසල ස්කන්ධයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ඔන්න ඔය විදියට පළවෙනි හිත අපි හඳුනා ගන්නවා. දැන් මේ කියපු ටිකෙන් කිව්වේ ඕනෑම පිංකමක් ඕනෑම කුසලයක් ඇතිවීමට හේතුවෙන විදියයි.

- **අනුලොමං ගොත්‍රභුස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**

තව එක්ක තිබෙනවා, කුසලයේ උපරිමයක්. දැන් විදර්ශනා චිත්ත වීථියක් පහළ වෙලා විදර්ශනා චිත්ත වීථියේ ඉහළට ගිහිල්ලා මාර්ග චිත්ත වීථියක් හටගන්නවා. ඒ මාර්ග චිත්ත වීථිය හටගන්න කොට පහළ වෙනවා **භවාංග චලන - භවාංග උපච්ඡේද - මනෝද්වාරා වජ්ජන - පරිකර්ම - උපචාර - අනුලෝම - ගෝත්‍රභූ - මාර්ග - ඵල** කියලා සිත් පෙළක් යනවා. මේ සිත් පෙළේ මේ ටික ප්‍රධානයි. මෙතන **ඵල** සිතට කලින් ඇතිවෙන්නේ **මාර්ග** සිතයි. මාර්ග සිතට කලින් ඇතිවෙන්නේ **ගෝත්‍රභූ** සිතයි. **ගෝත්‍රභූ** සිතට කලින් ඇතිවෙන්නේ **අනුලෝම** සිතයි. මේ සිත් පේළියක්. මේ එක සිතකින් කරන වැඩක් තිබෙනවා. ඒවාගේම තමයි ඒ හිත, ඒ අරමුණට අදාළ වැඩේ කරලා ඒක නැති වෙනකොට අභාවයට යනකොට ඒ එක්කම එන්නාවූ හිතට නැතිවෙලා යන සිතෙන් යම් කිසි ගැලපීමක් හදලා යනවා. යම්කිසි පූර්ව ශක්තියක් ඉස්සරහට තල්ලුකරගෙන යනවා. ඒක ගැලපෙන ශක්තියක් වෙනවා. ඒක නිසා **අනුලොමං ගොත්‍රභුස්ස සමනන්තරපච්චයෙන පච්චයො** කියලා කියනවා. **අනුලෝම** කියලා කියන්නා වූ විදර්ශනා සිත **ගෝත්‍රභූ** කියන්නාවූ නිවන් පැත්තට හැරෙන්නා වූ චිත්තයට සමනන්තර ප්‍රත්‍යය භාවයෙන්, ප්‍රත්‍යය ශක්තියෙන්, ගුණ ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා. මේ කිව්වේ සෝවාන් මාර්ග ඵල අවබෝධ කරගන්න තැන.

- **අනුලොමං වොදානස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**

**ගෝත්‍රභූ** කියන එක පහළ වෙන්නේ යම් කිසි කෙනෙක් සංසාරයේ ගිහිල්ලා ගිහිල්ලා යම් කිසි දවසක ඉස්සරවෙලාම නිර්වාණය ස්පර්ශ කරනවාද අන්න එදාට ඉස්සරවෙලාම ඒ නිර්වාණය ස්පර්ශ කරන, නිර්වාණය අවබෝධ කරන අවස්ථාවේදී තමයි ඔය සිත පහළ වෙන්නේ. ඒ කියන්නේ සෝවාන් මාර්ග

සිතට කලින්. ඊට පස්සේ සකෘදාගාමී මාර්ග චිත්ත වීථියක නැවතත් ගෝත්‍රභූ සිතක් පහළ වෙන්නේ නෑ. අනාගාමී මාර්ග චිත්ත වීථියක නැවත පහළ වෙන්නේ නෑ ගෝත්‍රභූ සිතක්. අරිහත් මාර්ග චිත්ත වීථියක නැවත ගෝත්‍රභූ සිතක් පහළ වෙන්නේ නෑ. මේ හැම තැනම පහළ වෙන්නේ අනුලෝම සිතට පස්සේ **වෝදාන** කියන සිත. පිරිසිදු වෙච්ච දෙයක් තව ටිකක් පිරිසිදු කරන්නා වූ **වෝදාන** සිත කියලයි ඒකට කියන්නේ. ඒක නිසා කියනවා **අනුලොමං වොදානස්ස සමනන්තරපච්චයෙන පච්චයො** කියලා.

මේ කිච්චේ මාර්ග ඵල අවබෝධ කරගන්න අවස්ථා දෙකක් පිළිබඳවයි. අනුලෝම සිතෙන් පස්සෙ ගෝත්‍රභූ සිත පහළ වෙන අවස්ථාව සහ අනුලෝම සිතෙන් පස්සේ වෝදාන සිත පහළ වෙන අවස්ථාව. ගෝත්‍රභූ සිතෙන් පස්සේ පහළ වෙන්නේ කෙලෙස් නසන හිත ශාන්ත කරන මාර්ග සිත.

- **ගොත්‍රභූ මග්ගස්ස සමනන්තරපච්චයෙන පච්චයො** = ගෝත්‍රභූ සිත සෝවාන් මාර්ග සිතට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙනවා.

  මේක සිදුවෙන්නේ සෝවාන් මාර්ග චිත්ත වීථියක. 'සකෘදාගාමී' 'අනාගාමී' 'අරහත්' මාර්ග චිත්ත වීථිවල මේක වෙනස් වෙනවා.

- **වොදානං මග්ගස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**

එතැනදී වෝදානය කියන්නාවූ පිරිසිදු කරන්නා වූ සිත සකෘදගාමී මාර්ග සිතටත් අනාගාමී මාර්ග සිතටත් අරිහත් මාර්ග සිතටත් සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙනවා. ඒ තමයි මාර්ග ඵල අවස්ථාවේදී සිද්ධ වෙන විදිය.

දැන් අපි මේ කිච්චේ සෝවාන් වෙන අවස්ථාවේදී ගෝත්‍රභූ සිතට පස්සේ පහළ වෙන මාර්ග සිත පිළිබඳව සහ සකෘදාගාමී අනාගාමී අරිහත් කියන්නාවූ අවස්ථාවේදී වෝදාන සිතට පස්සේ පහළ වෙන්නේ මාර්ග සිත් පිළිබඳව. මේ **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො** කියන කොටස.

## 2) දෙවෙනි වීථිය

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො** = කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙනවා.

මෙහි විසර්ජනා වාරය මේ විදියට යනවා.

- **කුසලං වුට්ඨානස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**

චිත්ත වීථියක අවසාන ජවනය තමයි 7 වෙනි ජවනය. මේ හත්වෙනි ජවනය කුසල සිතක්. හත්වෙනි ජවනයෙන් පසුව කුසල හිතක් නොවෙයි පහළ වෙන්නේ. ඒක තදාරම්මණයක්. සමහර චිත්ත වීථිවල තදාරම්මණ සිත් පහළ වෙනවා. සමහර චිත්ත වීථිවල තදාරම්මණ පහළ වෙන්නේ නෑ, භවාංග පහළ වෙනවා. එතකොට භවාංගය හෝ තදාරම්මණය හෝ කුසල සිතකට පසුව පහළ වෙනවා නම් එතැනදී කියනවා **කුසලං වුට්ඨානස්ස සමනන්තර පච්චයෙන පච්චයො** කියලා. ඒ කියන්නේ කුසල සිත ඊළඟට පහළ වෙන අව්‍යාකෘතයකට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක.

තවත් එකක් තිබෙනවා. අපි මේක අනන්තර ප්‍රත්‍යයෙදීත් කිව්වා.

- **මග්ගො ඵලස්ස සමනන්තරපච්චයෙන පච්චයො** = මාර්ග සිත ඵල චිත්තයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකර වෙනවා.

මාර්ග සිත කියන එක කුසල සිතක් හැටියට සලකනවා. ඵල සිත කියලා කියන්නේ මාර්ගයට අනතුරුව පහළ වෙන්නා වූ නිවන් අරමුණු කරන්නා වූ සිත. මාර්ග සිත ඵල චිත්තයට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. එතැනදී සිද්ධ වෙන්නෙත් **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො** කියන කථාව.

මේක සිද්ධ වෙනවා සෝවාන් මාර්ග සිතට පස්සේ සෝවාන් ඵල සිත පහළ වෙන අවස්ථාවේදී. ඒවාගේම සකෘදාගාමී අනාගාමී අරහත් කියන්නා වූ මාර්ග සිත් වලට පසුව ඵලය පහළ වෙනවා කියලා කියන්නෙත් කුසල ධර්මයක් අව්‍යාකෘතයකට ප්‍රත්‍යය වීම.

- **අනුලොමං සෙක්ඛාය ඵලසමාපත්තියා සමනන්තරපච්චයෙන පච්චයො.**

මේක අර ඉස්සෙල්ලා කියපු ඒවා වගේ නොවෙයි. අනුලෝම සිත කියලා කියන එක කුසල සිතක්. මෙතැන වචනයක් තිබෙනවා **සෙක්ඛාය** කියලා. සෙක්ඛාය කියලා කියන්නේ සෝවාන් සකෘදාගාමී අනාගාමී වෙච්ච උත්තමයන්ට. ඒ අයට කියන්නේ සේඛ පුද්ගලයන් වහන්සේලා කියලා. අපි හිතමු සේඛ පුද්ගලයන් වහන්සේලා ඵල සමපත්තියකට පත්වෙන්න යනවා කියලා. විදර්ශනාවේ උපරිමය තමයි අනුලෝම සිත. අනුලෝම සිතට පසුව පහළ වෙන්නේ ඵල සමාපත්ති සිත. ඒ කියන්නේ ඵල සිත් පහළ වෙනවා. ඵල සිත කියලා කියන්නේ **අව්‍යාකෘතයක්**. අනුලෝම සිත කියලා කියන්නේ **කුසල සිතක්**. මේක අදාළ වෙන්නේ ශෛක්‍ෂයන්ට පමණයි. ඒක නිසා මෙතැනදී කියනවා අනුලෝම කියන්නා වූ **කුසල සිත** ශෛක්‍ෂයන්ගේ වශයෙන් ඵල සමාපත්තිය කියන්නා වූ **අව්‍යාකෘත සිතට** සමනන්තර භාවයෙන්, සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා කියලා.

ඊළගට උපරිමයටම ගියහම

- **නිරොධා වුට්ඨානස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනකුසලං ඵලසමාපත්තියා සමනන්තරපච්චයෙන පච්චයො.**

මේ කියන කථාව ටිකක් ඉහළ තැනක්. නිතර කථා නොකරන තැනක්. මේක අපි බුදුගුණ වැඩීමක් වශයෙනුත් දහම් ගුණ වැඩීමක් වශයෙනුත් සඝ ගුණ වැඩීමක් වශයෙනුත් ධර්මය අවබෝධ කරගැනීමක් වශයෙනුත් බුදුරජාණන්වහන්සේගේ රහතන්වහන්සේලාගේ සිවුම් වූ මාර්ග ඵල සිත් පිළිබඳව දැනගැනීම් වශයෙන් කරන්නා වූ සාකච්ඡාවක් විග්‍රහයක්. කෙනෙකුට සමහරවිට හිතෙන්න පුළුවන් නිරෝධ සමාපත්ති ගැන කථා කරන එකේ වැඩේ මොකක්ද කියලා. අභිධර්මය විස්තර කරනකොට මේක අදාළයි. ඒ තැන ඕනෑ කෙනාට තේරුම් ගන්න අවශ්‍යයයි. ඒ නිසා අපි මේක කියන්න ඕනෑ.

**නිරොධා වුට්ඨානස්ස** - දැන් අපි හිතමු අනගාමීන් වහන්සේ නමක් නිරෝධ සමාපත්තියට සමවදිනවා කියලා. නිරෝධ සමාපත්තියට සමවදින්න අවශ්‍යයයි රූපාවචර ධ්‍යාන හතරයි අරූපාවචර ධ්‍යාන හතරයි. ඒකට කියනවා අශ්ඨ සමාපත්ති කියලා. මේ අශ්ඨ සමාපත්තියයි නිරෝධ සමාපත්තියයි ඔක්කොම සමාපත්ති 9 යක් වෙනවා. ඒ නමයට අනුපුබ්බ විහාර සමාපත්ති කියලා කියනවා.

දැන් මෙතැනදී ඉස්සෙල්ලාම නිරෝධ සමාපත්තියට සමවදිනවා. නිරෝධ සම්පත්තිය සමවදින්න නම් හිත නේවසඤ්ඤානාසඤ්ඤායතනයට යන්න ඕන. නේවසඤ්ඤානාසඤ්ඤායතනය කියන්නේ කුසල සිතක්.

**නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනකුසලං ඵලසමාපත්තියා සමනන්තරපච්චයෙන පච්චයො -** දැන් මේක කියනකොට සමහර කෙනෙකුට හිතෙන්න පුළුවන් නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසලය කිව්වහම රහතන් වහන්සේලාට කොහොමද ඒක කුසලයක් වෙන්නේ කියලා. මේක කියන්නේ අනාගාමී වහන්සේලා වශයෙන්. උන්වහන්සේලා නිරෝධ සමාපත්තියට සමවැදිලා ඊට පස්සේ නැවත නිරෝධ සමාපත්තියෙන් ගොඩවෙලා ස්වාභාවික සිත් වලට එන කොට එන්නේ අනාගාමී ඵල සිතට. අනාගාමී ඵල සිත අව්‍යාකෘතයි. නිරෝධ සමාපත්තියට පත්වෙන්න ඉස්සෙල්ලා පහළ වුනා වූ නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල සිත අනාගාමී ඵල සිතට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙනවා. ඒක නිසා කියනවා **'කුසලං ඵලසමාපත්තියා සමනන්තර පච්චයෙන පච්චයො'.**

කුසල ධර්මයන් අව්‍යාකෘත ධර්මයන්ට බලපාන විදිය අපි කොටස් හතරකින් කිව්වා. එකක් තමයි ජවනයෙන් තදාරම්මණයට නැත්නම් භවාංගය බලපාන විදිය. ඊළඟට මාර්ගයෙන් ඵල සිතට බලපාන විදිය. ඊළඟට ශෛක්ෂයන් වශයෙන් ගත්තහම අනුලෝම කියලා කියන්නාවූ විදර්ශනා කුසල සිත ඵල සමාපත්තියට බලපාන විදිය. අවසාන වශයෙන් නිරෝධයට සමාපත්තියට සමවදින අවස්ථාවේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල සිත ඵල සමාපත්තියට බලපාන විදිය.

**3) තුන්වෙනි වීථිය -** මෙතැන කියන්නේ අකුසල ධර්ම ගැන.

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො** = අකුසල ධර්මයක් අකුසල ධර්මයකට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක.

- **පුරිමා පුරිමා අකුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ඛන්ධානං සමනන්තරපච්චයෙන පච්චයො.**

මේ කියන්නේ පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නාවූ අකුසල සිත් 12 න් එකක් පසුව පසුව පහළ වෙන්නා වූ අකුසල ජවන් සිත්වලට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා = පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නා වූ අකුසල ඛන්ධ පසුව පසුව පහළ වෙන්නාවූ අකුසල ඛන්ධයන්ට සදුසු අවස්ථාව සුදුසු පරිසරය ලබා දීම වශයෙන් සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

## 4) හතර වෙනි විථිය

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො** = අකුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම.

- **අකුසලං වුට්ඨානස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**

මේ කියන දේ තේරුම් ගන්න අකුසල ධර්ම වැඩ කරන චිත්ත වීථියක අවසාන ජවනයට යන්න ඕනෑ. අවසාන ජවනයෙන් ගොඩවෙනකොට ඒ ජවනය නැතිවෙලා යනකොට ඊට පස්සේ පහළ වෙන්නේ ඒ අකුසල චිත්ත වීථියට සමානුපාතිකව තදාරම්මණයක් හෝ භවාංග සිතක්. ඒ තාදාරම්මණයට හෝ භවාංග සිතට අකුසල ධර්මය සමනන්තර භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

උදාහරණයක් හැටියට මෙහෙම තේරුම් ගත්තොත්, යම්කිසි මනුස්සයෙක් කෙනෙකුට බණිනවා. දොස් කියනවා. බණින කොට දොස් කියන කොට පහළ වෙන්නේ අකුසල් චිත්ත වීථි. අකුසල් චිත්ත වීථිවලින් තොරව ඔය වැඩේ කරන්න බෑ. එතකොට අකුසල් චිත්ත වීථිවල පළවෙනි ජවනයෙන් පස්සේ පහළ වෙන දෙවෙනි ජවනයත් අකුසල්මයි. එතකොට වෙන්නේ **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස**. දෙවෙනි එකෙන් තුන්වෙනි එකට යන කොටත් **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස**. තුන්වෙනි එකෙන් හතරවෙනි එකට, හතරවෙනි එකෙන් පස්වෙනි එකට, පස්වෙනි එකෙන් හයවෙනි එකට, හයවෙනි එකෙන් හත්වෙනි එකට යන කොටත් වෙන්නේ **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො**. මේ වීථියේ තිබෙන්නේ **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස** නිසා ඒ හත්වෙනි අකුසල ජවනයෙන් පස්සේ ඇතිවෙන්නේ තදාරම්මණයක් හරි එහෙම නැත්නම් භවාංගයක් හරි. භවාංගය කියන එක අකුසලයකුත් නොවෙයි. කුසලකුත් නොවෙයි. තදරම්මණයත් අකුසලකුත් නොවෙයි. කුසලකුත් නොවෙයි. ඒක නිසා අව්‍යාකෘතයක්. ඒක නිසා එතැනදී **අකුසලං වුට්ඨානස්ස**

**සමනන්තරපච්චයෙන පච්චයො** කියලා කියනවා. හත්වෙනි අකුසල් ජවනයෙන් අනතුරුව පහළ වෙන්නා වූ  භවාංගයට හෝ තදාරම්මණයට සමනන්තර භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

## 5) පස් වෙනි වීථිය

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො** = කුසලුත් නොවෙන අකුසලුත් නොවෙන ධර්මයක් එවැනිම කුසල් නොවෙන අකුසල් නොවෙන්නා වූ ධර්මයකට සමනන්තර භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

- **පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං සමනන්තරපච්චයෙන පච්චයො** = පළමුවෙන් පළමුවෙන් පහළ වෙන්නා වූ විපාක වශයෙන් පහළ වෙන අව්‍යාකෘතයෝ සහ ක්‍රියා මාත්‍රා වශයෙන් පහළ වෙන්නා වූ ක්‍රියා අව්‍යාකෘත ඛන්ධයෝ පසුව පසුව විපාක වශයෙන් පහළ වෙන අව්‍යාකෘතයන්ටත්  ක්‍රියා අව්‍යාකෘත ඛන්ධයන්ටත්  දෙකටම සමනන්තර භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

- **භවඞ්ගං ආවජ්ජනාය සමනන්තරපච්චයෙන පච්චයො.**

තව එකක් අපි බැලුවොත් එහෙම මේ හිත ඇතිවෙලා නැතිවෙලා යන  තැනක් තිබෙනවා. ඊළඟට හිත භවාංගයෙන් මතුවෙලා  ගොඩවෙලා  ක්‍රියාත්මක වෙන්න එනකොට කොහොමද කියලා බලමු. අපේ හිත වැඩි පුර තිබෙන්නේ භවාංගයක. භවාංගය කැඩිලා  බිඳිලා මතුවෙලා එන්නේ මනෝද්වාරා ආවජ්ජන වශයෙන් හෝ පංචද්වාරා ආවජ්ජන හැටියට. එතකොට භවාංග සිත විපාක අව්‍යාකෘතයක්. ආවජ්ජන සිත  ක්‍රියා අව්‍යාකෘතයක්.  **භවඞ්ගං ආවජ්ජනාය සමනන්තරපච්චයෙන පච්චයො -**  භවාංග උපච්ඡේදය වෙච්ච ගමන්ම ඒ හිත මනොද්වාරාවජ්ජනයට හරි පංචද්වාරාවජ්ජනයට හරි හැරෙන කොටම ආවර්ජන සිත ක්‍රියා අව්‍යාකෘතයක් නිසා සමනන්තරපච්චයෙන පච්චයො වෙනවා.  හරියට එතනදී ගලපලා දෙන්නේ ඒකයි.

කෙනෙක් අහන්න පුළුවන් දැන් භවාංගත් වැඩ කරනවානේ දිගටම. එතකොට භවාංගයෙන් භවාංගයට භවාංගයෙන් භවාංගයට යනවා. එහෙම යනකොට මොකක්ද වෙන්නේ කියලා. එතකොට වෙන්නේ අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීමම තමයි. එතැන තිබෙන්නේ 'විපාක අව්‍යාකෘතය' 'විපාක අව්‍යාකෘතයකටම' ප්‍රත්‍යය වෙනවා කියන එක. කලින් කිව්වේ 'විපාක අව්‍යාකෘතය' ආවර්ජනය කියන්නා වූ 'ක්‍රියා අව්‍යාකෘතයකට' සමනන්තර භාවයෙන් ප්‍රත්‍යය වෙන ආකාරය.

- **කිරියං වුට්ඨානස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**

තව තිබෙනවා ක්‍රියා ජවනය කියලා එකක්. රහතන්වහන්සේලා වශයෙන් ගත්තොත් ඒ ජවන් කුසලුත් නොවෙයි. අකුසලුත් නොවෙයි. ඒවා ක්‍රියා මාත්‍ර සිත් පමණයි. ඒ සිත් වල රැස් කිරීමේ ගුණයක් එකතු කිරීමේ ගුණයක් නෑ. එතකොට ඒ ක්‍රියා සිත, ඒ කියන්නේ රහතන්වහන්සේලාගේ ජවන් සිත් පේළියේ අවසාන හරියට ගියහම ඒ ක්‍රියා මාත්‍රයන් පමණක් වූ ජවන් අවසාන වෙනකොට තදාරම්මණයක් හරි නැත්නම් භවාංගයක් හරි ඉදිරිපත් වෙනවා. ඒ තදාරම්මණය හරි භවාංගය හරි ඇතිවෙන කොටත් තිබෙන්නේ අව්‍යාකෘතය ධර්මයක් තවත් අව්‍යාකෘත ධර්මයකට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම. ඒක මෙතැනදී මේ විදියට ලස්සනට ගලපලා දෙනවා. රහතන්වහන්සේගේ ක්‍රියා සිත අව්‍යාකෘතයක්. චිත්ත වීථියක අවසාන ජවනයෙන් පස්සේ වෙනස් කමක් තිබෙනවා. ඒ තමයි තදාරම්මණ සහ භවාංගය. ඒවා අව්‍යාකෘත ධර්ම. ඒ නිසා **කිරියං වුට්ඨානස්ස සමනන්තරපච්චයෙන පච්චයො** කියලා විග්‍රය අපිට කියලා දෙනවා.

- **අරහතො අනුලොමං ඵලසමාපත්තියා සමනන්තරපච්චයෙන පච්චයො.**

මීට කලින් අපි කිව්වා අනුලෝම සිතක් වැඩ කරනවා කියලා ඵල සමාපත්තියට කලින්. (නිරෝධ සමාපත්තියට කලින් නොවෙයි ඵල සමාපත්තියට කලින්). රහතන්වහන්සේලා රහත් උනාට පස්සේ ඒ ඵල සිත් වලින් නිවන් රසය අත් විඳිනවා. නිවන හොඳට විඳිනවා. ඒ නිවනේ ශාන්තිය විඳින්නේ ඵල සමාපත්ති සිත් හරහා. ඵල සමාපත්තියට ගොඩ වෙනකොට රහතන්වහන්සේලාගේ සිත්වල විදර්ශනා මණ්ඩලයක් යනවා. ඒ කියන්නේ සංස්කාර ධර්මයන්

ඇතිවීම් නැතිවීම් වශයෙන් මෙනෙහි කරගෙන යන්නා වූ සිත් පේළියක් යනවා. ඒ සිත් පේළියේ අවසාන සිත තමයි අනුලෝම සිත. උන්වහන්සේලා රහත් නිසා අනුලෝම සිතට පස්සේ මාර්ග සිත් පහළ වෙන්නෙත් නෑ, වෝදාන සිත පහළ වෙන්නෙත් නෑ. ඊළඟට මාර්ග සිත් පහළ වීමකුත් නැති නිසා රහතන්වහන්සේගේ අනුලෝම සිතෙන් පස්සේ ඵල සිත් තමයි පහළ වෙන්නේ. නමුත් ඒ අනුලෝම සිත කියන එක පෘතක්ජනයන් වශයෙන් ගත්තොත් ඒක කුසල් සිතක්. සෝවාන් වහන්සේ වශයෙන් ගත්තොත් ඒකත් කුසලයක්. සකෘදාගාමී අනාගාමීවහන්සේලා වශයෙන් ගත්තත් ඒක කුසලයක්. නමුත් රහතන්වහන්සේට ඒ අනුලෝම සිත කුසල් සිතක් වෙන්නේ නෑ. ඒක අව්‍යාකෘතයක් වෙනවා. ඵල සමාපත්තියත් රහතන්වහන්සේට අව්‍යාකෘතයක් වෙනවා. ඒක නිසා **අරහතො අනුලොමං ඵලසමාපත්තියා සමනන්තරපච්චයෙන පච්චයො** කියන විග්‍රය අපිට ලබා දීලා එතැන මෙනෙහි කරන්න සකස් කරලා දෙනවා.

- **නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනකිරියං ඵලසමාපත්තියා සමනන්තරපච්චයෙන පච්චයො.**

රහතන්වහන්සේ නමක් නිරෝධ සමාපත්තියට සමවැදිලා නැවතත් එනකොට **නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සිත** 'අරහත් ඵල' සිතට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

අනාගාමීන්වහන්සේලාට කුසල් සිතක් වෙන නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත රහතන්වහන්සේලාට ක්‍රියා සිතක් වෙනවා.

මෙතැනදීත් හරියට පිළිවෙලකට කියලා දෙනවා සමනන්තර භාවයෙන් අව්‍යාකෘත ධර්මයක් රහතන්වහන්සේගේ සිතට ගලපලා දෙන්නේ කොහොමද, අනාගාමී සිතට සමනන්තර භාවයෙන් ගලපලා දෙන්නේ කොහොමද, ඊළඟට පෘතක්ජන සිතට සමනන්තර භවයෙන් සකස් කරලා දෙන්නේ කොහොමද කියලා. ඒක කවුරුත් පිටින් ඇවිල්ලා කරන දෙයක් නොවෙයි. ඒක ධර්ම ස්වභාවයක්. ධර්ම ගුණ ස්වභාවයක්. ධර්ම ගති ස්වභාවයක්. ධර්ම ශක්ති ස්වභාවයක්. ඒක නිසා තමයි කෙලෙස් නොනසපු අය වශයෙනුත්, කෙලෙස් භාගයක් නසාපු අය වශයෙනුත්, ඒවාගේම කෙලෙස් සම්පූර්ණයෙන්ම නසාපු

අය වශයෙනුත් ගැලපෙන විදියට, මෙතෙන්ට ඕන වෙන්නේ මේ වගේ ශක්තියක් කියන එක හොඳටම ගලපලා දෙන්නේ සමනන්තර භාවය.

ඒක බැලුවොත් එහෙම වතුරක් ගලාගෙන යනකොට සමහර තැන්වල තිබෙනවා එක මට්ටමකින් ගලාගෙන ගිහිල්ලා ඊළඟට පොඩ්ඩක් ඇලවෙලා ගලාගෙන යනවා. එතකොට ඒකේ යම් කිසි හැඩක් තිබෙනවා. අපි හිතමු අඟලක් විතර බෑවුමක් තිබෙන සිමෙන්තියක් දිගේ වතුර ගලාගෙන යනකොට එක්තරා හැඩයකටයි යන්නේ. එතැනට ගැලපෙන විදිය තමයි ඒ. ඒක කවුරුවත් කරන එකක් නොවෙයි. ඒක ස්වභාවයෙන්ම සිද්ධ වෙන දෙයක්. ඊළඟට අපි හිතමු බෑවුම් ගතිය වැඩි තැනකින් වතුර ගලාගෙන යනවා කියලා. එතැනින් වතුර ගලාගෙන යනකොට ශබ්දයකුයි වේග ස්වභාවය වැඩි කිරීමකුයි දෙකක්ම සිද්ධ වෙනවා. ඒ වතුර වැටෙන තැනත් ශබ්දයක් හදලා දෙනවා. ඒ ස්වභාව ධර්ම ටික ඇති කරලා දෙන කෙනෙක් නෑ. ඒක ඒ බෑවුම් ගතිය නිසාම එතැන හැදෙන එතැන මතුවෙන එක්තරා විදියක ගුණ ස්වභාවයක්.

ඒවගේ තමයි රහතන්වහන්සේලා වශයෙනුත් අනාගාමීන් වහන්සේලා වශයෙනුත් අනිත් ආර්යන් වහන්සේලා වශයෙනුත් යම් කිසි සමාපත්තියකට සමවදින කොට එයට සුදුසු තැන තෝරලා දෙන සිතක් පහළ වෙන්නේ.

තව එකක් තිබෙනවා, පටලවා ගන්න හොඳ නෑ. නිරෝධ සමපත්තියයි ඵල සමපත්තියයි කියන දෙක විග්‍රහ කරන්නේ වෙනස් ආකාරයකට. නිරෝධය කියන එකේ තිබෙනවා අර්ථ දෙකක්. එකක් තමයි නැති වෙනවා කියන එක. නිවී යනවා කියන එක. නිරෝධ සමාපත්තිය කියන තැනේදී ඒ සමාපත්තියට සමවැදුනහම සිතුවිලි පහළ වෙන්නේ නෑ. ඒ නිසා ඵල සමාපත්ති සිතක තමයි ඔය අව්‍යාකෘත කථාව ගලපාගන්ට පුලුවන් වෙන්නේ. නිරෝධ සමාපත්ති අවසථාවේදී සිත් පහළ උනේ නැති උනාට නිරෝධ සමාපත්තියට කලින් පහළ වෙච්ච සිත නිරෝධ සමාපත්තියට එළියට එන අවස්ථාවේ බලපානවා. ඒකට කාලය බලපාන්නේ නෑ. ඒක අපි ඉස්සරහදි කියනවා.

## 6) හය වෙනි වීථිය

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො** මේකෙන් කියවෙන්නේ කුසලුත් නොවෙන අකුසලුත් නොවෙන අව්‍යාකෘත වූ ධර්මයක් කුසල ධර්මයකට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා.

- **ආවජ්ජනා කුසලානං ඛන්ධානං සමනන්තරපච්චයෙන පච්චයො.**

ඒක අපිට තේරුම් ගන්න පුළුවන් මේ විදියට. ආවජ්ජනා සිත කියලා එකක් තිබෙනවා. ඒ මනෝද්වාරාවජ්ජන සිත ඇතිවෙලා ඊට පස්සේ පහළවෙන්නා වූ පළවෙනි කුසල ජවනයක් තිබෙනවා. ඒ කුසල ජවනය පහළ වෙන්න කලින් තිබුණ ආවජ්ජන සිත අව්‍යාකෘතයක්. ඊට පසුව පහළවෙන් පළවෙනි ජවනය කුසලයක්. මෙන්න මෙතැන ගලපලා දීම තමයි **'ආවජ්ජන සිත කුසල ඛන්ධයකට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා'** කියලා කියන්නේ.

අනන්තර ප්‍රත්‍යය පිළිබඳව කථා කරලා තිබෙන නිසා අපිට මේ කාරණය තේරුම් ගන්න ඒ තරම් අමාරුවක් වෙන්නේ නෑ කියලා මම විශ්වාස කරන නිසයි මේ විදියට කියාගෙන යන්නේ.

## 7) හත් වෙනි වීථිය

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො** = අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට සමනන්තර භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

- **ආවජ්ජනා අකුසලානං ඛන්ධානං සමනන්තරපච්චයෙන පච්චයො.**

මෙතැනත් මනෝද්වාරාවජ්ජන සිතකට පස්සේ අකුසල වශයෙන් ගන්න කොට පහළ වෙන්නේ අකුසල් ජවන්. ආන්න ඒ අකුසල් ජවන් වීථියේ පළවෙනි ජවනය මනෝද්වාරාවජ්ජන සිතට පස්සේ පහළ වෙන නිසා ආවර්ජන සිත අව්‍යාකෘතයක්, පළවෙනි ජවනය අකුසල සිතක්. මේ විදියට අව්‍යාකෘත ධර්මයක් අකුසල ධර්මයකට සමනන්තර භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

අනන්තර භාවයයි සමනන්තර භාවයයි කියන එක ඔය විදියට වෙනස්ව තේරුම් ගන්නත් ඕන. සුදුසු විදියට සුදුසු තැනට සුදුසු ශක්තියෙන් යුක්ත වෙච්ච හිතක් ගලපලා මතුකර ගන්න උදව් වෙන නිසා මේකට කියනවා **සමනන්තර ප්‍රත්‍යය ධර්මය** කියලා. බැලූ බැල්මටම මේ දෙකේ හරි සමාන කමක් තිබෙනවා. වීථි වාරත් සමානයි. හැඩ වැඩත් සමානයි. ඒ කථා කරන ස්ථානත් සමානයි. ඒ උනත් පොඩි අංශුවක වෙනසක් තිබෙනවා. ඒ අංශු වෙනස තමයි ඔය විදියට මහා වෙනස් ආකාරයකට වෙනස් බලයක් තිබෙනවා කියලා ප්‍රත්‍යය දෙකක් හැටියට දක්වලා තිබෙන්නේ. ඒ නිසා අද මේ පින්වතුන්ට මම කියලා දුන්නා සමනන්තර ප්‍රත්‍යය සම්බන්ධයෙන් වීථි වාර 7ක්.

ඒ තමයි

1) **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**
2) **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**
3) **අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**
4) **අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**
5) **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො**
6) **අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**
7) **අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස සමනන්තරපච්චයෙන පච්චයො.**

අපිට තේරුම් ගැනීම සඳහා පට්ඨාන ප්‍රකරණයේ විසර්ජනා වාර කොටසේ චිත්ත වීථි සංග්‍රය දක්වන තැන කුසලයට අකුසලයට අව්‍යාකෘතයට බෙදලා වීථි වැඩ කරන ආකාර හත තමයි මේ. ඉතින් මේ කොටස අපේ පින්වතුන්ට ඉතාමත් වැදගත් වෙනවා. මේ තමයි හේතු ඵල ධර්මයන්ගේ හැටි. හේතු ඵල ධර්මයන්, නාම ධර්මයන් වැඩ කරන හැටි. නාම ධර්ම තවත් එහෙකට උපකාර වෙන විදිය තමයි මේ කියන්නේ. දැන් සාමාන්‍යයෙන් අපි හිතුවොත් එහෙම 'පිටි' කියන ජාතිය ඒකට ලැබෙන මාත්‍රාවත් එක්ක ඒක බොන්නත් පුළුවන් වෙනවා. කන්නත් පුළුවන් වෙනවා. කටේ ඇලෙන ස්වභාවයකුත් වෙනවා. නමුත් මේ එකම දේ. ඒක දියාරු උනොත් වතුර මාත්‍රාව වැඩි උනොත් බොන්න පුළුවන්. තරමකට උනොත් යන්තම් කන්න පුළුවන්. මධ්‍යම ප්‍රමාණයට ගියොත් ඇලෙනවා. එතකොට එකම දේ පුංචි පුංචි මාත්‍රා වල වෙනස්කම් නිසා වෙනස් වෙන ආකාරය සහ ගුණ මතුකරලා පෙන්නන ආකාරයයි තිබෙන්නේ.

ඒක නිසා මේ පින්වත් සැම දෙනාටම මේ උතුම් ධර්ම කාණ්ඩය මෙනෙහි කිරීම පිණිස ධර්ම ආරම්මණයක් වේවා! ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ උතුම් වූ බුදු හිතෙන් ඒ වාගේම සැරියුත් මහරහතන්වහන්සේගේ උතුම් වූ ඒ රහත් සිතෙන් මේ ධර්ම උන්වහන්සේලා මෙනෙහි කළා. ඒවාගේම අපිට තේරුම් ගැනීම සඳහා ආත්ම දෘෂ්ටිය නැතිකර ගැනීම සඳහා සක්කාය දෘෂ්ටිය නැතිකර ගැනීම සඳහා ධර්ම ස්වභාවයන් හඳුනා ගැනීම සඳහා එකාන්තයෙන්ම අපිට මේ ටික බුදුරජාණන්වහන්සේ විග්‍රහ කරලා තිබෙනවා. ඒ නිසා මේ උතුම් ධර්මය අසාගෙන මෙනෙහි කරගෙන සැම දෙනාටම කිසිම තැනකට කිසිම දෙයකට නොඇලී නොබැඳී පැතීම් වලින් තොරව හිත සංස්කාර ධර්මයන්ගෙන් නිදහස් කරගෙන වෙන් කරගෙන අයින් කරගෙන සැම දෙනාටම සංස්කාර හැදෙන්නේ නැති සංස්කාරයන්ගෙන් විනිර්මුක්ත වූ උතුම් වූ ශාන්ත වූ නිර්වාණ ධාතුව එකාන්තයෙන්ම සුවසේම අවබෝධ වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු ! සාධු! සාධු!

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස මම එක කොටසක් තෙරුම් ගත්තු විදිය හරිද කියලා බලන්න.

ස්වාමීන්වහන්ස කුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනව කියපු එක තැනක් තමයි ‘නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනකුසලං ඵලසමාපත්තියා සමනන්තරපච්චයෙන පච්චයො’ කියන තැන. එතනදී මම තේරුම් ගත්තේ ස්වාමීන්වහන්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල සිතකින් පසුව තමයි නිරෝධ සමාපත්තියට සමවදින්නේ කියලා. නිරෝධ සමපත්තියේදී සිත් ඇතිවෙන්නේ නෑ. නිරෝධ සමාපත්තියෙන් නැඟිටිනකොට අනාගාමී උතුමන්වහන්සේ කෙනෙක් අනාගාමී ඵල සිතට තමයි පත්වෙන්නේ. එතකොට නිරෝධ සමාපත්තියට සමවදින්න කලින් ඇති උන අවසාන නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල සිත සමනන්තර ප්‍රත්‍යයෙන් අනාගාමී ඵල සිතට ප්‍රත්‍යය වෙන හැටියට තමයි තේරුම් ගත්තේ. ඒ ආකාරයට තමයි අව්‍යාකෘතයෙදීත් නිරෝධ සම්පත්තිය ගැන කියපු තැනේදිත් තේරුම් ගත්තේ

ස්වාමීන්වහන්ස. ඒ විදියට තේරුම් ගැනීම නිවැරදිද කියලා තමයි දැන ගන්න ඕන ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

ස්වාමීන්වහන්සේ - හොඳයි ඒක ඒ විදියට තමයි වෙන්නේ මහත්තයා.

අපේ පින්වතුන් මේවා අහන්න. මේවා හිතන්න. ගැඹුරුයි කියලා අහකට දාන්න හොඳ නෑ. ඇත්ත වශයෙන්ම මේ දහම් කාණ්ඩ නිතර නිතර කථා කරන ඒවත් නොවෙයි. ඒ උනත් මේවා සමහර වේලාවට කෙනෙකුට හිතෙන්න පුළුවන් කුමකටද මේවා කථා කරලා මේකෙන් අපිට යෝනිසෝ මනසිකාරය ඇතිකර ගැනීමටත් අපේ කෙලෙස් නිවා ගන්නත් පුළුවන් වෙනවද කියලා ප්‍රශ්නත් ඇතිවෙන්න පුළුවන්. මේක ප්‍රායෝගිකව අපි දකින්න ඕන වෙන්නේ මෙහෙමයි. දැන් අපි පැයකට වැඩි කාලයක් කථා කළා. දැන් මේ කථා කරන අවස්ථාවේදී අපි බලන්න ඕනෑ මේ ධර්ම කථනයේදී ධර්ම ඇසීමේදී අපේ හිතට කුසල්ද පහළ උනේ අකුසල්ද පහළ උනේ කියලා. දේශනා කිරීමේදීත් කුසල්ද පහළ උනේ අකුසල්ද පහළ උනේ කියලත් අපි දැන ගන්න ඕන. අනිවාර්යයෙන්ම මේ කොටස අහනකොට කුසල් සිත් පහළ වෙනවාමයි. එතකොට අපිට ඒකෙන් ප්‍රතිලාභයක් තිබෙනවා. එතකොට ඇයි මේ අහන්නේ කියන එක පිළිබඳව උත්තරයක් හොඳට හමබ වෙනවනේ. ඊළඟට තව එකක් තමයි ආර්යන් වහන්සේලාගේ චින්තනයක් තමයි මෙතැන තිබෙන්නේ. ආර්යන් වහන්සේලා තමයි මේ විදියට චිත්ත වීථි ඇතුළුව ධර්මය බෙද බෙදා කොටස් කර කර ආත්ම දෘෂ්ඨී වලට යන්නේ නැතුව ධර්ම ස්වභාව ධර්ම ස්වභාව හැටියටම අරගෙන විග්‍රහ කරලා බලන්නේ. ආර්යන් වහන්සේලා ගිය තැන් වල තමයි අපි මේ හිත හසුරුවන්නේ. ඒක නිසාත් අපිට වැරදීමක් වෙන්නේ නෑ. අනිත් එක තමයි මේක ධර්ම මනසිකාරයක් වෙනවා. ධර්ම මනසිකාරයක් වෙනකොටත් ඒක ඒකාන්තයෙන්ම ප්‍රතිලාභයක් වෙනවා. ඒක නිසා මේ පින්වතුන්ට කුසල් වැඩෙනවා වාගේම අකුසල් වලින් දුරුවෙනවා. නිවනටත් ළංවෙනවා. සැම දෙනාටම භාග්‍යක් වෙනවා. ඒක නිසා හොඳට අහන්න. ඒවාගේම ගොඩක් ලොකුවට කරුණු ගන්නේ නැතුව එක එකක් තනි තනිව ඒ කියපු අදාළ තැනට යොමු කරලා මෙනෙහි කරන්න. ඒක හරි හොඳ භාවනාවක් වෙනවා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස අනන්තර ප්‍රත්‍යය සහ සමනන්තර ප්‍රත්‍යය යන දෙකේ වෙනස පොඩ්ඩක් තේරුම් කරලා දෙන්න. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - ඒකෙ වෙනස තේරුම් ගන්න ඕන මෙන්න මෙහෙමයි. උදාහරණයක් කිව්වොත් එහෙම මනුස්සයෙක් උඩ ඉඳලා පහළට ගල් කැටයක් විසි කරනවා කියලා හිතමු. ගල් කැටයක් විසි කරනකොට ඒ මනුස්සයාගේ අතේ තිබෙන ගලක් තමයි පහළට විසි කරන්නේ. එහෙම විසි කිරීම එකක්. ඊළඟට ඒ ගල විසිකරන එක්කෙනා නිකම්ම විසි කරනවා විතරක් නොවෙයි හරියටම තැනක් බලලා සුදුසු තැනක් බලලාම ගල් කැටේ වැටෙන්න විසි කරනවා.

දැන් අද කාලේ ක්‍රිකට් කියලා එකක් ගහනවනේ. දැන් බෝලයක් විසි කරායින් පස්සේ ඒ විසි කිරීමයි ඒ බෝලය තමන් කැමති තැනක් බලලා විසි කිරීමයි කියලා කියන්නේ දෙකක්. ආන්න ඒ බෝලය විසි කිරීම වගේ තමයි **අනන්තර ප්‍රත්‍යය**. හරියට කැමති තැනකට වැටෙන්න ඒ අදාළ ප්‍රදේශයට විසි කිරීම වගේ තමයි **සමනන්තර ප්‍රත්‍යය.**

තව එකක් තමයි අවුරුදු කාල වලට තිබෙනවා උත්සවයක්. ඒ උත්සවයේදී තිබෙනවා අලියට ඇහැ තියන්න කියලා එකක්. ඉතින් මිනිස්සු ඇස් පියාගෙන ගිහිල්ලා අලියට ඇහැ තියනවා. ඇහැ තිබෙන්න ඕන ඔළුව හරියෙනේ. සමහර වෙලාවට කන ගාවින් තියනවා. නැත්නම් හොඩවැල පැත්තට බරවෙන්න තියනවා. හැබැයි මොකක් හරි ඇහැක් තිබ්බම හරි. ඒක අනන්තර ප්‍රත්‍යය වගේ. හැබැයි හරි ගානට ඒ තැනට නියම විදියටම තිබ්බොත් තමයි හරියට අලියා සම්පූර්ණ වෙන්නේ. ඒ වගේ තමයි සමනන්තර භාවය. ඉස්සරවෙලා ඇතිවෙච්ච හිත නැතිවෙලා යනකොට ඊළඟට ඇතිවෙන්නා වූ ඵලයට සුදුසු විදියටම එකක් පහළ වෙන්න උපකාර වෙන උපකාර වීමට තමයි පළවෙනි පළවෙනි සිත්වලින් ලැබෙන්නා වූ සමනන්තර භාවය කියලා කියන්නේ.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස මේ මෑතකදී අහන්න ලැබෙන දෙයක් තමයි චිත්ත වීථි ගැන කථා කරනකොට විශේෂයෙන්ම පංචද්වාරාවජ්ජන චිත්ත වීථි මනෝද්වරාවජ්ජන චිත්ත වීථි ගැන කියනවා ඒවා බුද්ධ දේශිත ඒවා නොවෙන බවත් ඒවා අභිධර්ම සාහිත්‍යය බවත්. අදත් ස්වාමීන්වහන්සේ අපිට තේරුම් කරගෙන යනකොට ඒ චිත්ත වීථි කියන ඒ සකස් වීම සිදුවෙලා තිබෙන්නේ

විසර්ජනා වාර අනුව නේද කියලා වගේ තේරුණා. මොකද ඒක ගැලපෙන බව හොඳට පේනවා. මට හිතා ගන්න බෑ ඇයි එහෙම දෙයක් අපිට ඇහෙන්නේ මේ දවස්වල කියලා. ත්‍රිපිටක ග්‍රන්ථ වල චිත්ත වීථි ගැන සඳහන් වෙන්නේ නෑ පසුව කරන ලද සාහිත්‍යයේ තමයි මේ විදියට චිත්ත වීථි ගැන තිබෙන්නේ කියලා ඒවා විස්වාස නොකරන තත්වයකට කියන්නේ. ඉතින් අපි කැමතියි ඒ ගැන ඔබ වහන්සේ කොයි විදියටද හිතන්නේ කියන එක දැනගන්න. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - සාහිත්‍ය කියලා කියන්නේ නම් ලේඛනය. ලේඛනයක් නම් කරලා තිබෙනවා. ඒ ලේඛන ගත කරලා තිබෙන්නේ පෙළේ කියලා තිබෙන දේවල් තෙරුම් ගන්න බැරි හින්ද තමයි ඒක තවත් විස්තර විග්‍රහ කරලා මේ විදියයි ඕක සිද්ධ වෙන්නේ කියලා විස්තර විග්‍රහ කරලා තිබෙන්නේ. බුදුහාමුදුරුවන්ටත් බණ කියන්න යන කට්ටියක් පහළ වෙන කාලයක් මේක. සමහරු හරියට ඉහළින් ඉන්න යනවා. ඒක අනිවාර්යෙන්ම පේනවා. ඔය බොහොම අය ත්‍රිපිටකයෙන්ම ඉගෙනගෙන ඒවාගේම ධර්මය තිබෙන තැන් වලින්ම ඉගෙනගෙන කියාගෙන ඊට පස්සේ ඒවාටම ගරිහා කරන්නා වූ අකෘතඥවේදීන් බොහෝ පහළ වෙනවා. බුදුරජාණන්වහන්සේගේ කාලයේත් බුදුරජාණන්වහන්සේ ගාවට ආවේ භික්ෂුන්වහන්සේලා සහ අනිත් අය යමක් තේරුම් ගන්න බැරි හින්ද. සැරියුත් ස්වාමීන්වහන්සේ ළඟට ආවේ යමක් තේරුම් ගන්න බැරි හින්දා. ඒක නිසා උන්වහසේලා උදාහරණ ආදිය ඉදිරිපත් කරලා කියලා දෙනවා. ප්‍රායෝගිකව සිද්ධ වෙන දෙයක් තමයි මේකේ කියලා තිබෙන්නේ. මේක රහසක් නොවෙයි. අනිත් එක තමයි ඉස්සර කාලේ අද වාගේ නොවෙයි බොහොම නිහතමානී ස්වභාවයක් තිබුණා මිත්‍යා දෘෂ්ඨික භාවයෙන් අයින් වෙච්ච උත්තමයන්ගේ. යමක් ඉගෙන ගන්න කොට හරි ගෞරවාන්විතව ඉගෙන ගන්නවා. ගුරු ගෞරවය ධර්ම ගෞරවය බුද්ධ ගෞරවය තියලා. ත්‍රිපිටකයත් ලියලා තිබෙන නිසා එහෙම බැලුවහම සාහිත්‍යයක් තමයි. ඔක්කොම ලියලනේ තිබෙන්නේ.

බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙන්නා වූ දේවල් තමයි සැරියුත් ස්වාමීන්වහන්සේ විස්තර කරලා තිබෙන්නේ. ඒවත් තේරුම් ගන්න බැරි හින්ද තමයි පසු කාලීනව තව තවත් විස්තර කරලා තිබෙන්නේ. ඒ පසු කාලීනවත් විස්තර කරලා තිබෙන ඒවා තේරුම් ගන්න බැරි හින්ද තමයි ඊරුකානේ

ස්වාමීන්වහන්සේලා සහ ඔය තවත් ස්වාමීන්වහන්සේලා තවත් සරල කරලා කියලා දීලා තිබෙන්නේ. මේක තේරුම් ගන්න බැරි හින්දයි මේක මෙච්චර මෙහෙම කියන්නේ.

අද කාලේ බොහෝම අය වැඩිදුර ඥානවන්ත වෙන්න යනවා. අපි ඔයිට වඩා දන්නවා කියලා කියන්නේ. අනිත් එක තමයි මම දැකලා තිබෙනවා internet එකේ තවත් ස්වාමීන්වහන්සේලා හොඳ දහම් කරුණු ඉදිරිපත් කරලා බණ දෙශ්නාවල් කරලා තිබෙනවා. ඒ බණ දේශනාවල් වලට සමහරු සාධු කාර දීලා මල් දාල තිබෙනවා. 'මේක පළමුවෙන්ම අහනවා බොහොම පිං' කියලා පිං දීලා තිබෙනවා. සමහර අය ඇවිල්ලා ඒ බණ දේශනාවට මොකක් හරි ඒකට අදාළ නැති කැත වචන පේළියක් දාලා බැණලා ගිහිල්ලා තිබෙනවා. ඉතින් මම ඕක දැක්කට පස්සේ මේ වැඩේ මොකක්ද කියලා හිතුනා. මට හිතුනා මහත්තයා මෙන්න මෙහෙම එකක්.

ඔය පන්සලේ බණ ශාලාව තිබෙනවානේ. ඔය බණ ශාලාවේ මිනිස්සු ඉඳගෙන හාමුදුරුවන්ට වැඳගෙන නිවන් යන්න බණ අහනවා. ඒවගේම තමයි ඕකේ බලලෝ ඉන්නවනේ. ඔය බල්ලෝ ඇවිල්ලා කණු වලට මුත්‍රා කරලත් යනවා. ධර්ම ශාලාවේ පහරලත් යනවා. එකම තැන. එකම පණ තිබෙන සත්තු. එකම බණ ශාලාවේ සිද්ධ වෙන දෙයක්. ඔය වගේ කෙනක් නිවන් යන්න සාධු කාර දීලා තේරෙන දේ තේරෙන හැටියට ගන්නවා. තව එක්කෙනෙක් ඒකට ඇවිල්ලා විකාරයක් කරලා තමන්ට අදාළ නැති ගැලපෙන්නෙත් නැති තමන්ට තේරෙන්නෙත් නෑ කියන්නෙත් නැතුව මොකක් හරි එකක් කියලා නැත්නම් ලියලා යනවා. මහා පවු ගොඩක් සිද්ධ කරගන්නවා. ඒක නිසා ඒ අයට ගැලපෙන්න නොවෙයි අපි බණ අහන්න ඕන වෙන්නේ. ඒ අයගේ සිත් සතුටු කරන්න හරි ඒ ගොල්ලන්ට ගැලපෙන හැටියට නොවෙයි, අතීතයේ අපේ ථේරවාදී ස්වාමීන්වහන්සේලා පෙළ ගස්සලා තිබෙන ධර්ම නියායක් ක්‍රමයක් උගන්වන විදියක් තිබෙනවා. ඒ විදියටයි අපි ඉගෙන ගන්න ඕන වෙන්නේ. ඒක නිසා තමන් ස්වාදීන වෙන්න ඕනෑ. ලෝකයේ ඕන එක්කෙනෙක් කියපුවාවේ. මේකේ තිබෙන්නේ මෙහෙමයි. ඒ ගොල්ලන්ට ඕනේ නම් පිලිගත්තාවේ නැත්නම් නිකං හිටපුවාවේ. ලෝකේ තේරුම් ගන්නයි මම ඕක කිව්වේ.

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස මමත් ඒ සම්බන්ධව තමයි කියන්න හිතුවේ. දන් අපි අභිධර්මය කියලා ඉස්සෙල්ලාම ධම්මසංගණිප්‍රකරණයනේ පටන් ගන්නේ. එතකොට ඒ දේවල් ඉස්සෙල්ලාම බලන කොට මූලිකවම දැනුනේ ඒක අපිට තේරුම ගන්න බැහැ කියලා. පස්සේ රේරුකානේ චන්දවිමල ස්වාමීන්වහන්සේගේ අභිධර්මය ගැන සරලව ලියවුනු පොත් වල කියන්නේ සිත් ගැන. අකුසල සිත් කුසල සිත් ගැන. එතකොට ධම්මසංගණිප්‍රකරණයත් එක්ක බලනකොට ඒවා ගැලපෙන්නේ නෑ වගේ තමයි මුලින්ම තේරුණේ. පස්සේ ඒක ඒ පොත්වලින් ඉගෙන ගිහිල්ලා ආයිමත් ධම්මසංගණිප්‍රකරණ බලත්දී සම්පූර්ණයෙන්ම ඒකෙන් අරගෙන තිබෙන හැටි දැක්කහම හිතුන කොච්චර ලේසිද කියලා. ධම්මසංගණිප්‍රකරණය බලලා විතරක් ඕක තේරුම් ගන්න ගියානම් අපිටත් තේරුම් ගන්න බැරි වෙන්න තිබුණා සමහර විට. මට තේරුණේ සම්පූර්ණයෙන්ම ධම්මසංගණිප්‍රකරණයෙන්ම සිත් 89 අරගෙන චෛතසික අරගෙන චිත්ත වීථිවලට අරගෙන කොච්චර ලස්සනට අපිට ඒක පහසු කරලා දීලා තිබෙනවද කියන එක. මුලදී හිතුනොත් 'ධම්මසංගණිප්‍රකරණය විතරයි හරි. ඒකම විතරයි තේරුම් ගන්න ඕන අනිත් ඒවා හරියන්නේ නෑ' කියලා මට හිතෙන හැටියට තේරුම් ගන්න බැරිවෙනවා. මම තේරුම් ගත්තු විදියේ යම්කිසි වැරැද්දක් තිබෙනවද ස්වාමීන්වහන්ස?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒක හරි මහත්තයා. ඒ හිතපු තාලේ හරි හොඳයි. එහෙමම තමයි ඕක තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම මිනිස්සු පස්සේ කරන්න තිබෙන දේවල් ඉස්සෙල්ලා කරන්න යනවා. ඉස්සෙල්ලා කරන්න තිබෙන දේවල් පස්සේ කරනවා. ඕක හින්දා තමයි ඕක අමාරු. ලොකු පොත්වල තිබෙන දේවල් ඇත්ත වශයෙන්ම උගන්වන ක්‍රමයක් තිබෙනවා. අපේ පින්වතුනුත් මට කිව්වා මෙන්න මේ පොත කියවමු කියලා. මම කිව්වා ඕක ඔයගොල්ලන්ට කියවන්න බෑ තේරෙන්නේ නෑ කියලා. එහෙම කියපු හින්දා තමයි අද මේ පින්වතුන් මේකේ රැඳිලා ඉන්නේ. නැත්නම් මටත් බැනලා ගොඩක් කල් ගිහිල්ලා. ඔය Bruno මහත්තයා කියපු විදියට තමයි මහත්තය වෙන්න ඕනේ.

ඒක නිසා තමයි ඉස්සර කාලේ ස්වාමීන්වහන්සේලා එක පාරම පොතක් දෙන්නේ නෑ. අපි අභිධර්මය පැත්තකින් තියමු. අපි සූත්‍රයක් ගමු. සූත්‍රයේත් තිබෙනවානේ එක්තරා පිළිවෙලක්. දැන් මංගල සූත්‍රය ගන්නකො බලන්න. මංගල සූත්‍රයේ අවසානයේ කියන ටිකයි මුලින් කියන ටිකයි බලන්න කොච්චර වෙනස්ද කියලා. අවසාන හරියේ කියන්නේ **අසොකං විරජං ඛෙමං එතං මංගල මුත්තමං** කියලනේ. ඕවා මුලට දාන්නේ නැතුව එතනට යන විදියටනේ සූත්‍රයත් දේශනා කරලා තිබෙන්නේ.

ඒක නිසා මේවා උගනන්න දේශනා කරන්න පිළිවෙලක් තිබෙනවා. ඉස්සර කාලේ ස්වාමීන්වහන්සේලා අභිධර්මය කියන එක කියලා දෙන්න යොදා ගත්ත ගුරු උපදෙස් ලබාදෙන ක්‍රමයක් තිබෙනවා. ඒවා ලොකු පොත්වලට ගැලපෙන්නේ නැති ඒවා නොවෙයි. ඒ ගොල්ලන්ට තේරුම් ගන්න බැරි කමට අපි මොනවා කරන්නද? ඒක නිසා Bruno මහත්තයා කිව්වා වගේ අපිට තේරෙන හැටියට මේක කරගෙන යන එක තමයි තිබෙන්නේ. අනිත් අය තේරුම් ගත්තත් එකයි නැතත් එකයි. මොනවා කරන්නද? ඒ අයට හිතක් පහළ උනොත් එයි නැත්නම් වෙන අහක යයි.

හොඳයි ස්වාමීන්වහන්ස තෙරුවන් සරණයි. එහෙම නම් අද දවසේ අපි සාකච්ඡාව මෙතනින් නිමා කරමු. අප්‍රමාණ පිං ඔබ වහන්සේගේ කාලය ශ්‍රමය අපි වෙනුවෙන් මේ ආකාරයෙන් කැප කිරීම ගැන. මේක නිතර ඇහෙන ධර්මයක් නොවෙයි. ඉතාමත් ගාම්භීර වූ සූක්ෂම වූ ධර්මයක් ඔබ වහන්සේ අපිට සරලව පැහැදිලි කරලා දෙන්නේ. අපිත් මේ තාක් රැඳී ඉන්නෙත් ඒ සුමටව පැහැදිලි කරදීම නිසාමයි. ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ මේ කරනලද ධර්ම දානය ඔබවහන්සේගේ සත්‍යය අවබෝධය පිණිසම වේවා! කියලා අපි ප්‍රාර්ථනා කරනවා. ඔබවහන්සේට ඉතාමත් ගෞරවයෙන් යොමුවෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන්න. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - සැමදෙනාටම යහපතක් වේවා! තෙරුවන් සරණයි! අදත් අපි බුදුරජාණන්වහන්සේ දේශනා කරන ලද නිතර කථා නොවෙන අභිධර්ම කාණ්ඩයක එක්තරා ප්‍රදේශයක් පිළිබඳව අපි චිත්තයට අපේ ඥානයට

ගැලපෙන මට්ටමෙන් සාකච්ඡා කරන්න තමයි එකතු උනේ. ඒ තුලින් අපි සැම දෙනාම විසාල කුසල සිත් පරම්පරාවක්, විමර්ශනාත්මකව කරන දෙයක් එහෙම නැත්නම් ධම්ම විචය සම්බොජ්ඣංගය වැඩීමක් සිද්ධ කරගත්තා. මේ උතුම් වූ උදාර වූ කුසල ධර්මයන් වැඩීමේ බලයෙන් මේ පින්වත් සැම දෙනාටම සැනසිල්ලක් වේවා! විශේෂයෙන් මේ දහම් වැඩ සටහන පවත්වාගෙන යන්නා වූ මූලික චරිතයක් හැටියට කටයුතු කරන්නා වූ පිනවත් ලලිත් දළුවත්ත මහත්මයාට නිදුක් භාවය නීරෝගී භාවය සැලසේවා! ඒ මහත්මයාගේ ජීවිතියට සැනසිල්ලක් වේවා! ධර්මයෙන්ම ජීවිත ආලෝකමත් වේවා! ආරක්ෂා වේවා! ඒ මහතමයාටත් ඒ පවුලේ සැම දෙනාටමත් සුවසේ චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධය වේවා! කෙලවර අමා මහා නිවනින් සැනසෙන්න ලැබේවා! ඒවාගේම මෙහෙය වීම් කටයුතු සිද්ධ කලාවූ පින්වත් ජයන්ත මහත්තයාටත් අසාගෙන සිටියා වූ ප්‍රශ්න ඇසුවා වූ මහත්ම මහත්මීන් සැම දෙනාටමත් පසුව වෙලාවක මේවා අසන්නා වූ පින්වත් සැම දෙනාටමත් මේ පින් බලයෙන් ඒකාන්තයෙන්ම සැපසේම පාරමී ධර්මශක්තිය දියුණු කරගෙන ගොස් උතුම් අමා මහා නිවනින් සැනසෙන්ට ලැබේවා! නිර්වාණ අවබෝධය පිණිස මෙය මාර්ගයක් හේතුවක් උපනිශ්‍රයක්ම වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.